# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/33 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/14/05/2007.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.06.03 වැනි දිනැති හා අංක 1656/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010.05.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බදුල්ල, වෙළගෙදර, නො. 68 හි පදිංචි සී. වික්‍රමසිංහ මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.08.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
කම්කරු කොමසාරිස්.

2013 ඔක්තෝබර් මස 03 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය

එක් පාර්ශවයක් වශයෙන්,

සී. වික්‍රමසිංහ,<br>
නො. 68, වෙළගෙදර,<br>
බදුල්ල.

*ඉල්ලුම්කරු .........*

නඩු අංකය ፡ A/3333

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,<br>
අංක ፡ 200,<br>
කිරුල පාර,<br>
කොළඹ 05.

*වගඋත්තරකරු............*

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2010.05.19 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත කී පාර්ශවයන් අතර ඇති වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

01. "එවකට සීමාසහිත ඌව බස් සමාගම යටතේ පාලනය වූ මොණරාගල ඩිපෝවේ III - A ශ්‍රේණියේ නිලධාරී වශයෙන් සේවයේ යෙදී සිටි සී. වික්‍රමසිංහ මහතා වෙත පවත්නා විනය ව්‍යවස්ථාවට පටහැනිව සමාගමේ බලය නොමැති



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිලධාරියෙකු වූ බදුල්ල ඩිපෝවේ ඩිපෝ කළමනාකරු විසින් 2005.02.21 වැනි දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කිරීම කලා යයි දැක්වීම නිවැරදිද යන්න නිවැරදි වේ නම් ඔහුට කුමන සහනයක් ලැබිය යුතුද යන්න හා

02. එම චෝදනා පත්‍රය මත එවකට සීමාසහිත ඌව බස් සමාගමේ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරි විසින් 2005.06.23 වැනි දිනැති විනය නියෝගය මගින් 2005.02.07 වැනි දින සිට ඉදිරියට මාස හයක කාල සීමාවක් සඳහා වේතන රහිතව තාවකාලිකව සී. වික්‍රමසිංහ මහතාගේ සේවය අත්හිටුවීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවේ නම්, ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න හා

03. ඉන් අනතුරුව සීමාසහිත ඌව බස් සමාගමේ අභියාචනා මණ්ඩල සභාපති විසින් එම සමාගමේ III - A ශ්‍රේණියේ නිලධාරි සී. වික්‍රමසිංහ මහතා වෙත නිකුත් කරනු ලැබූ 2005.09.29 වැනි දිනැති අභියාචනා නියෝගය මගින් 2005.10.03 වැනි දින සිට 2006.02.02 වැනි දින දක්වා ඔහුගේ සේවය වේතන රහිතව මාස හතරකට තාවකාලිකව අත්හිටුවීම මගින් දී තිබූ දඬුවම් කාලය වැඩි කර තිබේද, තිබේ නම් එය යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න හා

04. සී. වික්‍රමසිංහ මහතාට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය ඉවත් කරන ලෙසට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරි විසින් එහි සභාපති වෙත කරනු ලැබූ නිර්දේශය නොසලකා හැරීම හේතුවෙන් සමස්ත ලෙස ගත් කල සී. වික්‍රමසිංහ මහතාට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න" පිළිබඳව වේ.

ඉල්ලුම්කාර 01 වන පාර්ශවය විසින් තම ආරවුල සම්බන්ධ විස්තර ප්‍රකාශය හා එහි කරුණු තහවුරු කරලීම සඳහා ඇමුණුම් 01 - 13 දක්වා ලේඛනද සමග 2010.10.04 වැනි දින දාතමින් ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කර තිබුණි. වගඋත්තරකාර 02 වන පාර්ශවය විසින් තම පිළිතුරු ප්‍රකාශයන් 2010.10.04 හා 2010.10.25 වැනි දින දාතමින් ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කර තිබුණි.

එකී විස්තර ප්‍රකාශයන් දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කිරීමෙන් පසු කීප වාරයක් මෙම නඩුව කැඳවීමෙන් අනතුරුව සමථයක් සඳහා පාර්ශවකරුවන් එකඟ කර ගැනීමට නොහැකි වූ හෙයින් 2011.05.24 වැනි දින මෙම ආරවුල විසඳීම සඳහා වූ විභාගය ආරම්භ විය. ඉල්ලුම්කාර 01 වන පාර්ශවය වෙනුවෙන් ඔහුද, ඔහුගේ නියෝජිත වයි. එම්. පුංචිබණ්ඩා මහතා ද, වගඋත්තරකාර 02 වන පාර්ශවය වූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් එහි සහකාර නීති නිලධාරිනි නිමාෂා අයන්ති මහත්මිය සමඟ රජයේ නීතිඥ නවීෂා ජයසිංහ මහත්මියද පෙනී සිටියදී 01 වන පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු වන සී. වික්‍රමසිංහ මහතා සාක්ෂියට කැඳවීය. (සාක්ෂි සටහන් ලිපි ගොනුව පිටු 42 සිට 96 දක්වා) ඔහු මූලික සාක්ෂියේදී A/01 සිට A/20 දක්වා වූ ලේඛන ඉදිරිපත් කර සළකුණු කර ඇත. එකී ලේඛන අතුරින් වගඋත්තරකරුගේ නීතිඥවරියගේ විරෝධතාවන්ට යටත්ව A/04 සහ A/05 දරණ ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත්ව ඉල්ලුම්කරු විසින් ලකුණු කර ඇත. (ඒ අනුව A/04 සහ A/05 දරණ ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කල ලේඛන හෙයින්ද, එකී ලේඛනවල අන්තර්ගතය සම්බන්ධයෙන් ඔප්පු කිරීම සඳහා ඉල්ලුම්කරු සාක්ෂි කැඳවීමට අපොහොසත් වූ හෙයින්ද එකී ලේඛන මෙම ප්‍රදානයේදී මවිසින් සලකා නොබැලූ බව මෙහි සටහන් කරමි).

ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂිය හරස් ප්‍රශ්නවලට භාජනය වී ඇත. ඔහුගේ සාක්ෂියෙන් පහත සඳහන් කරුණු සනාථ කර ඇති බව මා සෑහීමට පත්වීමි. එනම්,

01. A/01, A/02, A/03 ලේඛන අනුව ඉල්ලුම්කරුගේ පත්වීම පළමුව ඩිපෝ පරීක්ෂකවරයෙකු ලෙස නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට බවත්, පසුව උසස්වීමක් ලද බවත්, 2002.07.01 වැනි දින බදුල්ල ඩිපෝවේ කළමනාකරු ලෙස උසස්වීමක් ලද බව,

02. එවකට ඌව බස් සමාගමට අයත් බදුල්ල ඩිපෝවේ කළමනාකරු ලෙස ඩිපෝවේ සම්පූර්ණ පරිපාලන කටයුතු ඔහුට පැවරී තිබූ බව,

03. තම පරිපාලන කටයුතු සඳහා සහායවීමට සහකාර කළමනාකරු (පාලන) 2, සහකාර කළමනාකරු (මුදල්) 1, සහකාර කළමනාකරු (ඉංජිනේරු) 1, ඉල්ලුම්කරු යටතේ පත් කර තිබූ බව,

04. බදුල්ල ඩිපෝවේ අයකැමි වන එම්. ආර්ජින් මහතා අතින් මුදල් අඩුවක් සිදුව ඇති බව හා එකී මුදල් අඩුව රු. 24,079.55 ක් බව මුදල් සහකාර කළමනාකරු විසින් ඉල්ලුම්කරුට දන්වා සිටි බව යන එම අවස්ථාවේම මේ සම්බන්ධව ඉල්ලුම්කරු විසින් ආරක්ෂක අංශයේ කළමනාකරුට දන්වා අදාළ අයකැමි එම තනතුරෙන් ඉවත් කොට වෙනත් කෙනෙකු එම තනතුරට පත් කල බව,

05. එලෙස වෙනත් අයකැමි කෙනෙකුට රාජකාරි භාරදුන් විට එලෙස අඩුව තිබූ මුදල රු. 81,600 ක් වූ බවට ඔහු තමාට වාර්තා කල බව සහ එවිට සහකාර කළමනාකරු (මුදල්) සහකාර කළමනාකරු (පාලන) සමඟ ඉල්ලුම්කරු බදුල්ල පොලීසියට ගොස් මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කල බව,

06. ඉන් පසු බදුල්ල පොලීසිය විසින් මේ සම්බන්ධව විමර්ශන කටයුතු අවසන් කොට බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක BR 475 (A/06 ලේඛනය අනුව) ගොනු කල බව සහ එකී නඩුවේදී ඌව බස් සමාගම සහ විත්තිකරු වන එම්. ආර්ජින් මහතා අතර, ඇති වූ සමථය ප්‍රකාර එම්. ආර්ජින් මහතා විසින් එකී රු. 81,600 ක මුදල ඌව බස් සමාගමට ගෙවූ බව සහ ඒ අනුව නඩුව සමථ කිරීමෙන් අවසන් කල බව සහ එම්. ආර්ජින්ට නැවත ඌව බස් සමාගම විසින් රැකියාව දුන් බව,

07. මෙම මුදල් අඩුව සිදුව ඇත්තේ 2004.02.25 වැනි දිනය. ඉල්ලුම්කරුට ඩිපෝ කළමනාකරු ලෙස වාර්තා වී ඇත්තේ 2004.03.17 වැනි දිනය. ඉල්ලුම්කරු මේ සම්බන්ධව ඉහත

සඳහන් ලෙසට ක්‍රියාකර ගෙන යද්දී 2004.04.07 වැනි දින සිට ඔහුගේ රාජකාරිවලින් ඉවත් කර එම ඩිපෝවේම තවදුරටත් තබා ගන්නා ලද බවත්, 2004.09.07 වැනි දින දක්වා එලෙස එම ඩිපෝවේ රැඳී සිටි බවත්, 2004.09.07 වැනි දින සිට මොණරාගල ඩිපෝවට ඉල්ලුම්කරුව මාරු කර යවා 2005.02.07 වැනි දින තමාගේ වැඩ තහනම් කල බවත්, 2005.02.21 වැනි දින චෝදනා පත්‍රයක් තමාට දුන් බව සහ 2005.06.23 වැනි දින දඬුවම් දීම කල බව සහ 2005.09.29 වැනි දින අභියාචනා නියෝගය දුන් බව යන කරුණු.

08. ඉන් පසු ඉල්ලුම්කරුට සිදු වූ අසාධාරණය පිළිබඳව කම්කරු කොමසාරිස්ට පැමිණිල්ලක් කල බව සහ මේ සම්බන්ධව තමාගේ වැඩ තහනම් කිරීම හා දඬුවම් කිරීම ඉවත් කර දීමට මැදිහත් වන ලෙස කම්කරු කොමසාරිස්ගෙන් ඉල්ලා සිටි බවත්, එම ඉල්ලීමේදී (A/17 දරන ඉල්ලීම) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරි විසින් ද, (A/17 දරන ලිපිය අනුව) නිර්දේශයක් කල බවත්, ඒ අනුව කම්කරු කොමසාරිස් විසින් මෙම පැමිණිල්ල විභාග කොට රු. 1,15,715 ක හිඟ වැටුප, බෝනස් මුදල් ඉල්ලුම්කරුට ගෙවීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කල බව, (A/20 දරන ලිපිය අනුව)

ඉහත සඳහන් 01 සිට 08 ඡේදයන්හි සඳහන් කරුණු පිළිබඳව ඉල්ලුම්කරු මා සෑහීමකට පත්වන ලෙසට කරුණු තම සාක්ෂියේදී ඉදිරිපත් කල අතර, මාගේ ප්‍රදානය දීමේදී මෙම කරුණුද, ඉල්ලුම්කරුගේ හරස් ප්‍රශ්නවලට භාජනය වූ සාක්ෂිය සහ ඔහු විසින් 01 සිට 20 දක්වා (04, 05,ලේඛන හැර) ඉදිරිපත් කල ලේඛනද මා විසින් සැළකිල්ලට ගනිමි.

වගඋත්තරකරු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී සලකුණු කල R,R1, R1A, R1B, RIC, R2, R2A, R3, R4, R4A ලේඛන ද මා විසින් පරීක්ෂා කළෙමි.

ඉල්ලුම්කරුගේ සාක්ෂිය අවසානයේ ඉල්ලුම්කරු ඉල්ලා සිටියේ තමාව අසාධාරණ ලෙස සහ අයුක්තිසහගත ලෙස වැටුප් රහිතව වැඩ තහනම් කර සිටි කාලය සඳහා හිඟ වැටුප් ලෙස රු. 11,5715 ක මුදලක් ද (මෙම හිඟ මුදල එසේ බවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මොණරාගල ඩිපෝව මගින් කම්කරු කොමසාරිස් අමතා ඇති A/19 ලෙස සළකුණු කල ලිපියෙන් තහවුරු වී ඇත.) ප්‍රසාද දීමනාව සහ වැඩ තහනම්ව සිටි කාලය සඳහා ලැබිය යුතු අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ද තමාට ලබාදෙන ලෙසට ය.

වගඋත්තරකරු වෙනුවෙන් එක් සාක්ෂියක් පමණක් ඉදිරිපත් කරන ලදී. එම සාක්ෂිකරු වූයේ බදුල්ල ඩිපෝවේ වර්තමාන ප්‍රධාන ලිපිකරු වූ රත්නායක මුදියන්සේලාගේ සිසිර රත්නායකයි. (ලිපි ගොනුවේ පිටු අංක 96 සිට 120 දක්වා සාක්ෂි සටහන්) ඔහුගේ සාක්ෂිය ඉල්ලුම්කරු විසින් හරස් ප්‍රශ්නවලට භාජනය කර ඇත. ඔහු විසින් සලකුණු කල R/01, R/02, R/02 "a" R 05, R/05 "a", R 06, R 07, R08, R/08 "a", R 08 a (1)' R/09, R/10, R 11 ලේඛනද ඔහුගේ සාක්ෂියද විමසා බැලීමෙන් පසු පහත සඳහන් නිගමනයන්ට මා පැමිණියෙමි.

01. මෙම ආරවුලට අදාළ සිද්ධිය සම්බන්ධ වූ කිසිදු පරීක්ෂණයක මෙම සාක්ෂිකරු සහභාගී නොවූ බව,

02. මුදල් පිළිබඳව අඩුවක් හෝ වංචාවක් සිදු වී තිබෙන බව දැන ගත්තොත් වහාම මේ පුද්ගලයාව එම විෂයයෙන් අයින් කල යුතුයි හා ඊට පසුව පොලිසියට වාර්තා කල යුතු බව සහ සිද්ධිය වූ දිනයේම පොලීසියට පැමිණිලි කල යුතුයි යන්න සාක්ෂිකරු සඳහන් කලද එලෙස පොලිසියට එදිනම පැමිණිලි කළයුතු බවට සඳහන් කිසිදු නියෝගයක්, චක්‍ර ලේඛනයක් හෝ උපදෙසක් ඇති ලේඛනයක් සාක්ෂිකරු ඉදිරිපත් නොකළ බව,

03. චෝදනා පත්‍රය අත්සන් කර තිබෙන්නේ නිසි බලධාරියා නොව ඩිපෝ කළමනාකරුය. (සැ.යු. : ඔහුට ඉහළ පරිපාලනයේ අනුමැතිය ඇතිව අත්සන් කල හැකිය යන්න මෙම සාක්ෂිකරු සඳහන් කළද, ඒ සම්බන්ධව ලිඛිතව සනාථ කිරීමට සාක්ෂිකරු කිසිදු ලිඛිත සාක්ෂියක් හෝ ලේඛනයක් ඉදිරිපත් නොකළ බව.

04. මෙම ඉල්ලුම්කරුට අදාළ පෞද්ගලික ලිපි ගොනුව වගඋත්තරකාර මණ්ඩලය භාරයේ තිබුණද, එම ගොනුවේ මෙම සිද්ධියට අදාළ කරුණු හෝ වාර්තා නොමැති නිසාත්, හා ඒවා තිබෙන්නේ විනය ලිපි ගොනුවේ බව වගඋත්තරකාර පක්ෂය විසින් සඳහන් කල නිසා එකී ලිපි ගොනුව ඉදිරිපත් කර සාක්ෂි දීමට සාක්ෂිකරු සූදානම් බව කියා සිටියද, ඔහුගේ සාක්ෂියේදී එකී ලිපි ගොනුව හෝ අදාළ ලිපි හෝ කිසිවක් කිසිවිටෙකත් ඉදිරිපත් නොකළ බව,

05. ඩිපෝ කළමනාකරුට මුදල් වගකීම පවරන්නට බැහැ යනුවෙන් සාක්ෂිකරු සඳහන් කලද, ඒ සම්බන්ධව විශේෂිතව සඳහන් වන නියෝගයක් හෝ ලේඛනයක් හෝ ලිඛිත උපදෙසක් මෙම සාක්ෂිකරු ඉදිරිපත් නොකල බව,

සභාපතිට නීති නිලධාරි විසින් නිර්දේශයක් ඉදිරිපත් කිරීමට හැකිද යන්න පිළිබඳව ඇසූ ප්‍රශ්නයට නැහැ යන්න ලෙස සාක්ෂිකරු පිළිතුරු දුන්නද, ඒ සම්බන්ධව සනාථ කිරීමට කිසිදු ලිඛිත සාක්ෂියක් සාක්ෂිකරු ඉදිරිපත් නොකළ බව ඉල්ලුම්කරු විසින් A/10 ලෙස සලකුණු කල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාව (A/10) යන ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු යන දෙපාර්ශවයම විසින් සළකුණු කල A/12 සහ R/02 යන ඌව බස් සමාගමේ චක්‍ර ලේඛනය අනුකූලව නිසි ලෙස මෙම ඉල්ලුම්කරු සම්බන්ධව විනය කටයුතු කලේද යන්න පිළිබඳව සනාථ කිරීමට වගඋත්තරකාර පක්ෂයට අවශ්‍ය වී නම් වගඋත්තරකරු හට ඉල්ලුම්කරුගේ විනය ලිපි ගොනුව ඉදිරිපත් කර එහි ලේඛන මගින් සාක්ෂි දිය හැකිව තිබුණද වගඋත්තරකාර මණ්ඩලය එය ඉදිරිපත් කර සාක්ෂි දීමට අසමත් වීමෙන්ම ඌව බස් සමාගම මෙම ඉල්ලුම්කරු සම්බන්ධයෙන් නිත්‍යානුකූලව හා අදාළ ව්‍යවස්ථා අනුව කටයුතු කර නොමැති බවට මුල් බැල්මටම සැකයක් ඇති වන බවත්, මම නිගමනය කරමි.

වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂියට කැඳවූ මෙම සාක්ෂිකරු හුදෙක් මේ සම්බන්ධව අදාළ ලේඛනයන් ඉදිරිපත් නොකර ඒ සම්බන්ධව තමාගේ මත පමණක් ප්‍රකාශ කල සාක්ෂිකරුවෙකු ලෙසට මම ඒත්තු ගතිමි.

ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරි වෙත යොමු කරන ලිපිය (A/17) සහ එකී ලිපියේ සභාපතිතුමා වෙත නීති නිලධාරි විසින් නිර්දේශ කර ඇති කරුණුද, මෙම කාරණය කම්කරු කොමසාරිස් ඉදිරියේ විභාග වෙමින් පවතිද්දී නැවතත් එකී නිලධාරියා විසින් කම්කරු කොමසාරිස් වෙත එවන ලද ලිපිය (A/18) කම්කරු කොමසාරිස් විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති අමතා 2008.08.27 වැනි දින එවන ලද ලිපියද, (A/20) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ මෙම සිද්ධියට මුල් වූ එම්. ආර්ජින් සමග තිබූ බදුල්ල මහේස්ත්‍රාත් උසාවියේ නඩු අංක බී ආර් 475/04 දරන නඩුවේ ඇති වූ සමථය (A/06) ප්‍රකාරව කරන ලද නියෝගයද, ඉල්ලුම්කරු විසින් මෙම විභාගයේදී ඉදිරිපත් කල A/01 සිට A/20 දක්වා ලේඛනද, වගඋත්තරකරු විසින් ඉදිරිපත් කල R/01 සිට R/10 දක්වා වූ ලේඛනද දෙපාර්ශවයේ වාචික සාක්ෂි සහ ලිඛිත දේශන මවිසින් පරීක්ෂාවට ලක් කලෙමි.

ඒ අනුව මා තීරණය කරනු ලබන්නේ බදුල්ල ඩිපෝ කළමනාකරු විසින් 2005.02.01 වැනි දින දාතමින් ඉල්ලුම්කරුගේ සේවය 2005.02.07 වැනි දින සිට වේතන රහිතව තහනම් කිරීමේ ලිපිය (A/08) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල විනය ව්‍යවස්ථා මාලාවේ (A/10) සහ ඌව බස් සමාගමේ සංශෝධිත අදාළ චක්‍ර ලේඛනය (A/12) ට පටහැනි බවත්, වැරදි බවත් හා තම බලය ඉක්මවා යාමක් බවත්, එකී සේවය තහනම් කිරීමෙන් ඉල්ලුම්කරු හට අසාධාරණයක් හා අයුක්තියක් සිදුව ඇති බවත්, එකී බදුල්ල ඩිපෝ කළමනාකරු විසින්ම 2005.02.21 වැනි දින දාතමින් ඉල්ලුම්කරුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කිරීම (A/13 R/01) ඉහත කී විනය ව්‍යවස්ථා මාලාවන්ට පටහැනි මෙන්ම වැරදි සහගත බවත්, තම බලය ඉක්මවා කටයුතු කිරීමක් බවත්, ඒ අනුව එකී චෝදනා පත්‍රය ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් හා අයුක්තියක් සිදුව ඇති බවත්, එම චෝදනා පත්‍රය මත 2005.06.23 වැනි දිනැති නියෝගය (A/15) මඟින් 2005.02.27 වැනි දින සිට මාස 06 ක කාල සීමාවක් සඳහා වේතන රහිතව ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවීමත්, හා 2005.09.29 වැනි දින අභියාචනා නියෝගය මඟින් (A/16) 2005.10.03 වැනි දින සිට 2006.02.02 වැනි දින දක්වා ඉල්ලුම්කරුගේ සේවය වේතන රහිතව මාස 04 කට නැවත අත්හිටුවීම යුක්තිසහගත සහ සාධාරණ නොවන බවත්, මා නිගමනය කරමි. තවද ඉහත කී විනය නියෝගයන් ඉවත් කරන ලෙසට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරි විසින් එහි සභාපති වෙත කරනු ලැබූ නිර්දේශ (A/17) නොසලකා හැරීමෙන් ඉල්ලුම්කරු හට අසාධාරණයක් සිදුව ඇති බව මම නිගමනය කරමි.

ඒ අනුව මාගේ ප්‍රදානය වන්නේ 2005.02.07 වැනි දින සිට 2006 ජනවාරි මාසය අවසානය දක්වා වූ ඉල්ලුම්කරුට වේතන රහිතව වැඩ තහනම් කර සිටි කාලය සඳහා ඔහුට නිත්‍යානුකූලව හිමි විය යුතු රුපියල් එක්ලක්ෂ පහලොස් දහස් හත්සිය පහලොවක (රු. 1,15,715) මුදල මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කල දින සිට එක් මසක් ඇතුළත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට ගෙවිය යුතු බවත්,

ඉහත කී කාලය සඳහා එනම්, 2005.02.07 වැනි දින සිට 2006.02.02 වැනි දින දක්වා කාලය සඳහා නිත්‍යානුකූලව හිමිවිය යුතු ප්‍රසාද දීමනා සියල්ල ගණනය කොට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කල දින සිට එක් මසක් ඇතුළත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට ගෙවිය යුතු බවත්,

ඉහත කී කාලය සඳහා එනම්, 2005.02.07 වැනි දින සිට 2006.02.02 වැනි දින දක්වා ඔහුගේ වේතනයට එක් කල යුතු අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ගණනය කොට එකී ව්‍යවස්ථාපිත මුදල් ඉල්ලුම්කරුට ලබා ගැනීමට කටයුතු කල බවත්, මෙම ප්‍රදානයෙන් තීන්දු කොට නියෝග කර සිටිමි.

එල්. ගල්හේන,
(බේරුම්කරු).

2013 ක් වූ අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ කම්කරු මහලේකම් කාර්යාලයේ කාර්මික අධිකරණයේදීය.

11-126

---

මගේ අංකය : IR/14/02/2007.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.07.27 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බදුල්ල, හිඳගොඩ, හංවැල්ල, කුට්ටියගොල්ල පාර, අංක 26/14 හි පදිංචි එච්. එන්. එච්. හෙන්නායක මිය හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.09.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 සැප්තැම්බර් මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක : IR/1/14/02/2007.

කාර්මික අධිකරණයේ දී ය

එක් පාර්ශවයක් වශයෙන්,

එච්. එන්. එච්. හෙන්නායක මිය,
අංක 26/14, කුට්ටියගොල්ල පාර,
හංවැල්ල, හිඳගොඩ,
බදුල්ල.

*ඉල්ලුම්කරු .........*

නඩු අංකය : A/3398

අනෙක් පාර්ශවය වශයෙන්

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක : 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*වගඋත්තරකරු............*

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2011.07.27 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරවුල මෙසේය.

01. ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඌව) කාර්යාලයේ සේවය කල එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය යතුරු ලේඛක සේවයේ III වන පන්තියේ සිට II වන පන්තියේ "අ" ඛණ්ඩයට උසස් කිරීම 1998.05.28 වැනි දින වශයෙන් එම මණ්ඩලය විසින් තීරණය කිරීම නිසාවෙන් යම් අසාධාරණයක් සිදුව ඇද්ද, සිදුව ඇතොත් ඇයට හිමි සහන මොනවාද,

02. එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය විසින් 1996.06.25 වැනි දින සිදු කරන ලදැයි දක්වන වරදකට දඬුවම් පමුණුවීම 2002.02.28 වැනි දින දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද,

03. එච්. එන්. එච්. හෙන්නායක මහත්මියට 2002.01.01 වැනි දින සිට ලංකා විදුලිබල මණ්ඩලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභයන් අවුරුදු පහ (05) ක කාලයක් සඳහා අත්හිටුවීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමිද යන්න හා,

04. එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය වයස අවුරුදු හතලිස් පහ (45) සම්පූර්ණවීම මත යතුරු ලේඛක සේවයේ II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමෙහි පිළිවෙත (චක්‍රලේඛය) ඇයට ක්‍රියාත්මක කළ යුතුව තිබුනේද, එසේ වූයේ නම් ඇයට කුමන සහනයක් ලැබිය යුතුද යන්න පිළිබඳව වේ.

දෙපාර්ශවයම සිය ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශවය 2011.11.17 වැනි දින සිය නඩුව ආරම්භ කරමින් ඉල්ලුම්කාරිය සාක්ෂියට කැඳවන ලදී. ඇයගේ සාක්ෂිය අවසන් කිරීමෙන් අනතුරුව නඩුව අවසන් කරන ලදී. වගඋත්තරකාර පාර්ශවය නඩුව ආරම්භ කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශවය 2013.02.07 වැනි දින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය අවසන් කිරීමේ අංශයේ නිලධාරියෙකු කැඳවීමට අවසර ඉල්ලා සිටි අතර, වගඋත්තරකරුද ඊට එකඟවීම මත ඉහත සාක්ෂියට ඉඩ දෙන ලදී. ඉල්ලුම්කාරිය සිය නඩුව අවසන් කොට ලකුණු කරන ලද A/01 සිට A/19 ලේඛන අතුරින් A/04 ලේඛනය හැර ලකුණු කරන ලද ලේඛනවල පිළිගත් ඡායා පිටපත් සමඟ මුල් ලේඛනද බේරුම්කරණයට භාරදෙන ලදී. ඉල්ලුම්කාර පාර්ශවය ලකුණු කරන ලද A/15 හා A/16 දරන ලේඛන ඡායා පිටපත් වන අතර, එම ලේඛන දෙකෙහිම බලධාරියෙකු අත්සන් කර නැති හෙයින් ඔප්පු කිරීමට යටත්ව ලකුණු කර තිබූ අතර, එම ලේඛන ඔප්පු කිරීමට ද ඉල්ලුම්කාර පාර්ශවය අපොහොසත් විය.

ඉල්ලුම්කාර පාර්ශවය නඩුව අවසන් කිරීමෙන් අනතුරුව වගඋත්තරකාර පාර්ශවය නඩුව ආරම්භ කරමින් මානව සම්පත් නිලධාරි එල්ලාවල ලියනගේ ප්‍රියදර්ශනි නෙලුම් මහත්මිය සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව නඩුව අවසන් කොට නඩුව අවසානයේදී ලකුණු කරන ලද R/01 සිට R/40 දක්වා ලේඛන අතුරින් R/33 දරන ලේඛනය නොමැතිව ලිඛිත සැලකිරීම් නඩුව අවසානයේදී ගොනු කරන ලදී. R/33 වශයෙන් ලේඛනයක් බේරුම්කරණයේදී ලකුණු කර නොතිබුණි.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී ඇති පළමු කරුණ වනුයේ :-

"ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඌව) කාර්යාලයේ සේවය කල එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය යතුරු ලේඛක සේවයේ III වන පන්තියේ සිට III වන පන්තියේ "අ" ඛණ්ඩයට උසස් කිරීම 1998.05.28 වැනි දින වශයෙන් එම මණ්ඩලය විසින් තීරණය කිරීම නිසාවෙන් යම් අසාධාරණයක් සිදුව ඇද්ද, සිදුව ඇතොත් ඇයට හිමි සහන මොනවාද" යන්න ය.

ඉල්ලුම්කාරිය ඉහත වගඋත්තරකරු යටතේ සේවයට බැඳී ඇත්තේ A/01 පත්වීම් ලිපිය පරිදි 1986.02.17 වැනි දින බව දෙපාර්ශවය ඉදිරිපත් කල සාක්ෂි අනුව තහවුරු විය. වගඋත්තරකාර ආයතනයේ ඉල්ලුම්කාරිය දරන ලද තනතුර අනුව උසස්වීම් දැක්වෙන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය A/02 වශයෙන් ඉල්ලුම්කාරිය ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත ලේඛනය වගඋත්තරකරුද පිළිගෙන තිබිණ. ඉහත ලේඛනය පරිදි M 4 වැටුප් පරිමාණයේ III පන්තියට බඳවා ගන්නා අයගේ තනතුර ස්ථිර කිරීමෙන් පසුව සතියක පුහුණුවක් ලබා ගැනීමෙන් අනතුරුව III පන්තියේ අවුරුදු 04 ක සේවා කාලයකින් පසුව යෝග්‍යතා පරීක්ෂණයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම මත II "ආ" පන්තිය ලබාගත හැකි ය. යෝග්‍යතා පරීක්ෂයෙන් සමත් නොවූවකු නම් අවුරුදු 10 ක සේවා කාලයක් තිබීම හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම මත II "ආ" ශ්‍රේණියට පත්විය හැකි බව වැඩිදුරටත් A/02 ලේඛනයේ දැක්වේ.

ඉහත ඉල්ලුම්කාරිය අවුරුදු හතර සම්පූර්ණ වීමෙන් අනතුරුව එම පරීක්ෂණයට පෙනී සිට නැති අතර, වාර්ෂිකව එම පරීක්ෂණයට පෙනී සිටිය හැකි වුවද, ඉල්ලුම්කාරිය එලෙස පෙනී සිට නැති බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය. ඉල්ලුම්කාරියට II "ආ" ශ්‍රේණිය ලබාදීම අවුරුදු 10 සම්පූර්ණ වීමෙන් පසුව සිදුව තිබූ බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව අනාවරණය වේ. A/02 ලේඛනය අනුව අවුරුදු 10 සම්පූර්ණවීමෙන් අනතුරුව යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් නොවූවද සම්මුඛ පරීක්ෂණයෙන් සමත්විය යුතු බව ඉහත ලේඛනයේ සඳහන්ව ඇත.

ඉල්ලුම්කාරියට ඉහත II "ආ" ශ්‍රේණිය ලැබී ඇත්තේ 1998.05.28 වැනි දින දරන ලිපිය මගින් 1997.02.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බව R/09 ලේඛනය ඉදිරිපත් කරමින් වගඋත්තරකරු සඳහන් කල අතර, ඉල්ලුම්කාරිය ලකුණු කරන ලද A/03 ලේඛනය අනුව ඉහත කරුණ සනාථ වේ. වගඋත්තරකාර පක්ෂය ඉල්ලුම්කාරියට 1998.05.28 වැනි දින දරන ලිපිය මගින් 1997.02.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉහත පත්වීම ලබාදී ඇති බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කාරියගේ පත්වීම් ලිපිය පරිදි අවුරුදු 10 සම්පූර්ණ වන්නේ 1996.02.17 වැනි දින වන අතර, එදින සිට ඇයට ඉහත පත්වීම ලබා නොදීමට තුඩුදුන් හේතු වගඋත්තරකරු විසින් බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

ඉල්ලුම්කාරිය සේවය කරමින් සිටියදීම පවරනු ලැබූ රාජකාරිය ඉටු නොකර බැහැර යාම සම්බන්ධයෙන් 1994.09.08 වැනි දින ලබාදී ඇති අවවාද ලිපියක් R/02 වශයෙන් වගඋත්තරකරු ඉදිරිපත් කල අතර, එම ලිපියේ සඳහන් සිද්ධිය සිදුව තිබූ බව ඉල්ලුම්කාරියගේ සාක්ෂියෙන්ද අනාවරණය විය. ඉල්ලුම්කාරියට 1995.01.31 වැනි දින දිවා ආහාරය සඳහා නියමිත වේලාවට අමතර වේලාවක් ගැනීම සම්බන්ධයෙන් ලිපියක් ලබාදී ඇති අතර, එහි පිටපතක් R/03 වශයෙන් වගඋත්තරකරු ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉල්ලුම්කාරිය රාජකාරි කටයුතු නොසැලකිලිමත්ව, අකාර්යක්ෂමතාවයෙන් සිදු කිරීම මත 1995 වැටුප් වර්ධකය වසරකට අත්හිටුවා තිබු බව 1995.07.20 වැනි දින දරන R/04 ලේඛනයෙහිද සඳහන්ව ඇත. ඉහත ලේඛනය ඉල්ලුම්කාරියද පිළිගෙන තිබිණ.

ඉහත දඬුවම් ලබාදී තිබූ කාලය තුළ ඉල්ලුම්කාරිය ඊට එරෙහිව පියවර ගෙන තිබූ බවට බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත්ව නොතිබිණි. ඉල්ලුම්කාරිය සිය මූලික සාක්ෂියේදී 1994 වසරේ සිට 1996 වනතුරු වැටුප් වර්ධක නොලැබුණු බවට ඉල්ලුම්කාරිය සාක්ෂි ඉදිරිපත් කර තිබුණි. වගඋත්තරකරු විසින් ලකුණු කරන ලද R/01, R/06, R/07, R/10, R/10 "a", R/11 දරන ලේඛන අනුව ඉල්ලුම්කාරිය ඉදිරිපත් කල ඉහත කරුණු බිඳ වැටෙන අතර, ඉහත ලේඛනවල සඳහන් පරිදි වැටුප් වර්ධක ලබා තිබූ බව පිළිගත හැකිය. ඒ අනුව 1994, 1995, 1996 යන වසරවල වැටුප් වර්ධක ඉල්ලුම්කාරිය ලබා ගෙන තිබූ බව පිළිගත හැකිය.

ඉල්ලුම්කාරියගේ අකාර්යක්ෂමතාවය හේතු කොට ගෙන සේවා කාලය අවුරුදු 10 ක් තුළදී ලබාදිය යුතු උසස්වීම වසරක් ප්‍රමාදවී ලබාදී තිබූ බව වගඋත්තරකරු සඳහන් කල කරුණ ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකි අතර, එය සාධාරණ හා යුක්තිසහගත හේතූන් මත සිදුකර තිබූ බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව සනාථ වේ.

දෙපාර්ශවය අතර පවතින පළමු ආරවුල III පන්තියේ සිට II පන්තියේ "ආ" ශ්‍රේණියට පත් කිරීම බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉහත පත්වීම ඉල්ලුම්කාරියට ලබාදී ඇත්තේ 1997.02.17 වැනි දින සිට බව A/03 හා R/09 ලේඛන අනුව පිළිගත හැකිය. R/09 ලේඛන නිකුත් කල දිනය වන 1998.05.28 වැනි දිනය පදනම් කරමින් එම දිනයේ සිට III පන්තියේ සිට II "අ" ශ්‍රේණිය ලබාදුන් බව තීරණය කර ඇතත්, ලබාදී ඇත්තේ II පන්තියේ "ආ" කාණ්ඩය බවද, එසේ ලබාදී ඇත්තේ 1997.02.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බවද, ඒ අනුව මෙම යොමු කිරීම නිවැරදි නොවන බවද R/09 ලිපිය පදනම් කර දිනය හා ශ්‍රේණිය දෝෂ සහිතව ඉහත යොමුව ඉදිරිපත් කර තිබෙන බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය A/02 වශයෙන් ඉල්ලුම්කාරිය බේරුම්කරණයට ලකුණු කොට තිබූ අතර, මේ අනුව යතුරු ලේඛක සේවයේ බඳවා ගැනීම M 4 III පන්තිය වන අතර, ඊළඟ උසස්වීම M 3 II "ආ" වේ. II "ආ" පන්තියේ අවුරුදු 07 ක සේවා කාලයකින් පසුව යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම හෝ නිදහස්වීම හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම වන ඊ ළඟ II "අ" ශ්‍රේණිය ලබාගත හැකි බව A/02 ලේඛනයේ සඳහන්ව ඇත. වයස අවුරුදු 45 ඉක්මවීම කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් විය හැකි වුවද අවුරුදු 07 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම II "අ" ශ්‍රේණිය ලබා ගැනීමට අවශ්‍ය බව මානව සම්පත් නිලධාරිනිය බේරුම්කරණයට සාක්ෂි සඳහන් කරමින් කල අතර, එම සාක්ෂියද බිඳ හෙළීමට ඉල්ලුම්කාරිය අපොහොසත් විය. A/02 ලේඛනය අනුව වගඋත්තරකරු ඉදිරිපත් කල සාක්ෂිය නිවැරදි බව පිළිගත හැකිය.

ඉහත සඳහන් වූ සාක්ෂි අනුව ඉල්ලුම්කාරිය 1986.02.17 වැනි දින පත්වීම ලබා ගැනීමෙන් අනතුරුව ඉල්ලුම්කාරියගේ අකාර්යක්ෂමතාවය මත දඬුවම් දීම හේතු කොට වසරක් ප්‍රමාද වී වසර 10 ක් සම්පූර්ණවීම මත 1997.02.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි M 3 II "ආ" ශ්‍රේණියට උසස්වීමක් ලැබී ඇති බවත්, ඒ අනුව ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුව නැති බවත්, බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරුව ඇති බව මම නිගමනය කරමි.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති දෙවන ආරවුල මෙසේය.

"එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය විසින් 1996.06.25 වැනි දින සිදු කරන ලදැයි දක්වන වරදකට දඬුවම් පමුණුවීම 2002.02.28 වැනි දින දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද," යන්න.

ඉහත සිද්ධියට අදාළ චෝදනා පත්‍රය ඉල්ලුම්කාර පාර්ශවයේ A/05 වශයෙන්ද, වගඋත්තරකරු එම චෝදනා පත්‍රයේ පිටපතක් R/14 වශයෙන් ලකුණු කොට තිබූ අතර, එම චෝදනා පත්‍රය 1999.11.29 වැනි දිනෙන් යුතුව නිකුත් කර තිබෙන බව අදාළ ලේඛන අනුව තහවුරු වේ. ඉහත නඟන ලද චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා අනාවරණය වී ඇත්තේ චෝදනා නඟන ලද කාලයට පසුව බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

වගඋත්තරකාර මණ්ඩලයේ සේවය කල සේවකයින් 101 දෙනෙකුගේ පමණ වෛද්‍ය බිල් වංචාවක් අනාවරණය වූ බවද, ඒ පිළිබඳව පරීක්ෂණය පැවැත්වීමට කාලයක් ගත වූ බවද, ඒ අනුව චෝදනා පත්‍රය 1999.11.29 වැනි දිනෙන් යුතුව ලබාදී තිබූ බව වගඋත්තරකරු සඳහන් කල අතර, එම කරුණ ඉල්ලුම්කාර පාර්ශවයද ප්‍රතික්ෂේප කොට නොතිබුණි.

ඉහත චෝදනා පත්‍රය ඉල්ලුම්කාරියට ලාබ දීමෙන් අනතුරුව ඉල්ලුම්කාරිය 1999.12.13 වැනි දින පිළිතුරු ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එකී පිළිතුරු ප්‍රකාශය පදනම්ව ඉල්ලුම්කාරිය වරද පිළිගැනීම මත විනය පරීක්ෂණයක් නොපවත්වා ඊට දඬුවම් ලබාදී තිබූ බව වගඋත්තරකරු සඳහන් කල අතර, ඊට අදාළ ලේඛන R/19, R/20 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණි. ඉහත ලේඛනවල පිටපත් ඉල්ලුම්කාර පාර්ශවයද A/06, A/07 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

ඉල්ලුම්කාරිය යතුරු ලේඛක සේවයේ II "අ" ඛණ්ඩයේ කාර්යක්සමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරන ලෙස ඉල්ලීමක් කිරීමෙන් අනතුරුව විධිමත් විනය පරීක්ෂණයකින් තොරව දඬුවම් ලබාදීම සිදුව ඇති හෙයින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන බවට 2003.10.17 වැනි දින A/08 ලිපිය මගින් දැනුම් දුන් බවද ඉල්ලුම්කාරිව සඳහන් කර තිබිණ. එසේ දැනුම් දී ඇතත්, විනය පරීක්ෂණයක් පවත්වා නොතිබූ බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

මෙම ඉල්ලුම්කාරියගේ සේවා කාලය වසර දහය (10) සම්පූර්ණ වීමෙන් පසුව කරන ලද ඉල්ලීමක් මත 1998.06.19 වැනි දින දරන A/03 ලිපිය II පන්තියේ "ආ" පන්තියට උසස්වීමක් 1997.02.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදී ඇත. ඉල්ලුම්කාරියට එම දිනය වන විට කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් විය හැකි බව අවුරුදු 45 ඉක්මවීම ඊට හේතුව බවටත් සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ. II "ආ" පන්තියේ සිට වසර 07 ක් සම්පූර්ණ වීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයකින් ද සමත් වීමෙන් අනතුරුව II "අ" ශ්‍රේණිය ලැබෙන බවත්, ඉල්ලුම්කාරිය II "ආ" ශ්‍රේණියට පත්ව ඇත්තේ 1997.02.17 වැනි දින සිට බවද, ඒ අනුව වයස 45 සම්පූර්ණවීම මතම ඉහත තනතුර නොලැබෙන බව වගඋත්තරකරු සඳහන් කල අතර, එම සාක්ෂිය ඉල්ලුම්කාරිය බිඳ හෙළීමටද අපොහොසත් විය.

ඉහත උසස්වීම් ලබාදී ඇත්තේ 1998.06.19 වැනි දින දරන A/03 ලිපිය මඟිනි. මෙම උසස්වීම ලැබෙන විට ඉල්ලුම්කාරියට ඉහත චෝදනා පත්‍රය ලබාදී නැත. ඉල්ලුම්කාරිය නඟන ලද චෝදනාවට පදනම් වී ඇත්තේ 1996.05.10 වැනි දින සිට 1996.05.14 වැනි දින දක්වා කාලයට අදාළ 1996.05.25 වැනි දිනැති බඳුල්ල ලංකා නර්සිං හෝම් සාත්තු නිවාසයෙන් ලබාදී තිබූ බිල් පත්‍රයකි. ඉහත චෝදනාවට කරුණු පසුකාලීනව හෙළිවීම හේතුකොට ගෙන ඉල්ලුම්කාරියට නඟන ලද චෝදනා පත්‍රය 1999.11.29 වැනි දිනෙන් යුතුව ලබාදී තිබූ බව බේරුම්කරණයේදී අනාවරණය විය.

ඉහත චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා පිළිගැනීම හේතු කොට ගෙන පරීක්ෂණයක් නොපවත්වා ඉල්ලුම්කාරියට දඬුවම් ලබා දී ඇත්තේ 2002.02.28 වැනි දිනැති R/17 දරන ලේඛනය මඟිනි. එකී දඬුවම් වනුයේ 2002.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු 05 ක කාලයක් සඳහා වෛද්‍යාධාර ක්‍රමය යටතේ අනුග්‍රහයන් අහිමි කිරීම හා එක් වැටුප් වර්ධකයක් එක් අවුරුදු කාලයක් සඳහා නැවැත්වීම වේ.

ඉහත ලිපිය මගින් එක් අවුරුදු කාලයක් සඳහා පමණක් වැටුප් වර්ධකය නවත්වා ඇති හෙයින් ඉල්ලුම්කාරියට සෙසු වැටුප් වර්ධක ලබා ගැනීමේ හිමිකමක් තිබෙන බව පිළිගත හැකිය. 1999.07.06 වැනි දින සිට ඉල්ලුම්කාරියට නිකුත් කරන ලද R/18 දරන ලිපිය මඟින් හේතු විමසීමක් කර තිබූ බව පිළිගත හැකි වුවද, ඊට දඬුවමක් ලබාදී තිබූ බව බේරුම්කරණයේදී අනාවරණය නොවුණි. ඉල්ලුම්කාරිය සිය සාක්ෂියේදී 1994 සිට 2003 දක්වා වැටුප් වර්ධක නොලැබුණු බව සඳහන් කලද, පසුව 1994 සිට 1998 දක්වා වැටුප් වර්ධක ලැබූ බව සඳහන් කර තිබිණ.

වගඋත්තරකරු ඉල්ලුම්කාරියට ලබාදී තිබූ 1998.05.28 වැනි දින දරන ලිපිය පරිදි II "ආ" වන පන්තියේ උසස්වීම පරිදි 1998.02.17 වැනි දින සිට වැටුප් වර්ධක ලබාගත හැකි බව R/09 ලේඛනය අනුව අනාවරණය වේ. ඉල්ලුම්කාරිය හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 2012.05.24 වැනි දින සාක්ෂි සටහනේදී 12 වැනි පිටුවේ 1995, 96, 97, 98 වසරවල වැටුප් වර්ධක දුන් බවද, 1999, 2000, 2001 යන වර්ෂවලට හිමි වැටුප් වර්ධක ඉල්ලුම්කාරියට නොගෙවූ බවද ඉල්ලුම්කාරිය සඳහන් කර තිබිණ. ඉල්ලුම්කාරිය 1994, 1995, 1996, 1997 යන වර්ෂවල වැටුප් වර්ධක නොගෙවූ බවට සාක්ෂි ඉදිරිපත් කිරීම හේතු කොට ගෙන වගඋත්තරකරු R/01, R/06, R/07, R/10, R/11 දරන ලේඛන ඉදිරිපත් කරමින් ඉල්ලුම්කාරියට ඉහත කාලයට අදාළ වැටුප් වර්ධක ගෙවූ බව සඳහන් කර තිබූ අතර, ඉල්ලුම්කාරිය ඉහත වැටුප් වර්ධක ලැබූ බව පිළිගෙන තිබිණ.

1999, 2000, 2001 වසරවල් සඳහා වැටුප් වර්ධක ගෙවා නැති බව ඉල්ලුම්කාරිය සඳහන් කර තිබිණ. විනය පරීක්ෂණය හේතු කොට ගෙන ඉල්ලුම්කාරියට 2002 වසරේ වැටුප් වර්ධකය පමණක් අහිමි වී ඇත.

ඉහත කාරණාවට අදාළ චෝදනා පත්‍රය නිකුත් කර ඇත්තේ 1999.11.29 වැනි දිනෙන් යුතුවය. එම කාලය තුළ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට ඉඩ දී තිබූ බව හෝ ඉන් පසුව විනය පරීක්ෂණයේදී ඉහත වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන තිබූ බව බේරුම්කරණයේදී අනාවරණය නොවුණි.

වගඋත්තරකාර මණ්ඩලයේ විනය කාර්ය පරිපාටියක් තිබෙන බවද, එහි සඳහන් නොවන කරුණු ආයතන සංග්‍රහයෙන් ලබා ගන්නා බවද, මානව සම්පත් නිලධාරිනිය සඳහන් කර තිබිණ. ආයතන සංග්‍රහය අනුව වරද සිදු කල දිනය පදනම්ව දඬුවම් පැමිණවීම සිදු කරන බවද, වගඋත්තරකරු එසේ සිදු නොකොට චෝදනාව නිකුත් කල දිනයේ සිට දඬුවම් පැමිණවීම අසාධාරණ බවද, ඊට අදාළ රෙගුලාසි වගඋත්තරකාර මණ්ඩලය සතු වන බව ඉල්ලුම්කාරිය සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ. අධ්‍යක්ෂ මණ්ඩලය චෝදනා පත්‍රය නිකුත් කල දිනයේ සිට දඬුවම් පැමිණවීමට තීරණය කර තිබෙන බව වගඋත්තරකරු සඳහන් කලද, ඊට අදාළ ලේඛන බේරුම්කරණයට ඉදිරිපත් කර නොතිබුණි. ඉල්ලුම්කාරිය සඳහන් කල පරිදි ආයතනයේ පවතින රෙගුලාසි ඉදිරිපත් කර සිය සාධාරණය තහවුරු කිරීමට බේරුම්කරණයේදී අපොහොසත් විය.

1996.05.10 වැනි දින සිට 1996.05.14 වැනි දින දක්වා කරන ලද වරදක් පසුව අනාවරණය වීම මත පදනම්ව ඉහත චෝදනාව ඉල්ලුම්කාරියට නඟා ඇත. එසේම ඊට අදාළව නිලධාරීන් 101 කට ආසන්න සංඛ්‍යාවක් චෝදනාවට ලක්වූ බවට සාක්ෂි ඉදිරිපත් කර තිබිණ. ඉල්ලුම්කාරිය එය ප්‍රතික්ෂේප කර නොතිබුණි. මෙම චෝදනාවට ලක්වන කාලයට පසුව එනම්, 1997.02.17 වැනි දින සිට බලපාන පරිදි ඉල්ලුම්කාරිය යතුරු ලේඛක සේවයේ II

ශ්‍රේණියේ "ආ" ශ්‍රේණියට උසස්වීම් ලැබී තිබූ බවද තහවුරු විය. 1999.11.29 වැනි දින චෝදනා පත්‍රය ඉදිරිපත්වීම තුළින් ඉහත චෝදනාවට පදනම් කාලය නොසලකා හැර ඉහත උසස්වීම ලැබී තිබෙන බවද පිළිගත හැකිය. ඉහත සියළුම කරුණු සැලකිල්ලට ගෙන ඉහත වංචාව අනාවරණය වීමක චෝදනා පත්‍රය ලබාදී ඇත්තේ පසුව බවද, මෙම චෝදනාව පදනම්ව 101 දෙනෙක් වෙනුවෙන් පරීක්ෂණ පැවැත්වීම හේතුකොට ගෙන බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉහත පරිදි ප්‍රමාද වීමට හේතු තිබූ බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කාරිය සඳහන් කල පරිදි 1999, 2000, 2001 වැටුප් වර්ධක ගෙවා නොතිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉහත පරීක්ෂණය පවත්වා ඇත්තේ වගඋත්තරකාර මණ්ඩලය වන අතර, ඒ අනුව කාලයක් ගතවීම ඉල්ලුම්කාරියගේ ක්‍රියා කලාපය හේතුකොට ගෙන සිදුව නැති බව පිළිගත හැකිය. ඒ අනුව ඉහත කාලයට ගෙවිය යුතු වැටුප් වර්ධක සම්බන්ධයෙන් වගඋත්තරකරු තීරණයක් ගත යුතුව තිබෙන බව පිළිගත යුතුය. ඉල්ලුම්කාරියට 1999, 2000, 2001 වැටුප් වර්ධක අහිමි කිරීමට වගඋත්තරකරු තීරණයක් ගෙන නැති බව R/17 ලේඛනය අනුව පිළිගත හැකිය. A/02 ලේඛනය පරිදි කාර්යක්ෂමතා කඩඉම සමත්වීම අවශ්‍ය වුවද, එයට ඉල්ලුම්කාරිය පෙනී සිට නැත්තේ ඉහත පරීක්ෂණය හේතු කොට ගෙන බවද අනාවරණය වන කරුණකි. එම කරුණ සලකා ඊට සහනයක් සැලසීම වගඋත්තරකරුගේ කාර්ය භාරය වේ. එලෙස සහනයක් ලබා දී තිබූ බව බේරුම්කරණයේදී අනාවරණය නොවුණි. 1999, 2000, 2001 වර්ෂවලට අදාළව වැටුප් වර්ධක නොගෙවීම තුළින් තවත් දඬුවමක් ඉල්ලුම්කාරියට ලබාදී තිබෙන බව පිළිගත හැකිය. ඒ අනුව ඉල්ලුම්කාරියට 1999, 2000, 2001 වර්ෂවල වැටුප් වර්ධක ගෙවීම සාධාරණ යුක්තිසහගත බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව මම නිගමනය කරමි.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති තුන්වන ආරවුල මෙසේය.

"එච්. එන්. එච්. හෙන්නායක මහත්මියට 2002.01.01 වැනි දින සිට ලංකා විදුලිබල මණ්ඩලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභයන් අවුරුදු පහ (05) ක කාලයක් සඳහා අත්හිටුවීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමිද" යන්නයි.

වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ වංචාවක් සිදු කිරීම මත A/05 චෝදනා පත්‍රය 1999.11.29 වැනි දින අත්සනින් යුතුව වගඋත්තරකරු ලබාදී ඇත. එම චෝදනා පත්‍රයේ සඳහන් මුදල තමාගෙන් අයකර ගෙන අදාළ චෝදනාවෙන් නිදහස් කරන ලෙස ඉල්ලුම්කාරිය 1999.12.13 වැනි දින දරන A/06 ලිපියෙන් ඉල්ලා ඇත. ඉල්ලුම්කාරිය ඉහත චෝදනාව ප්‍රතික්ෂේප කොට නැත. ඉහත බිල් පත්‍රය ඉල්ලුම්කාරියගේ ස්වාමි පුරුෂයා විසින් ඉදිරිපත් කර ඇති බවත්, එය නිකුත් කල ආයතනයෙන් වෙනස් කර බවද, A/06 ප්‍රකාශයේ සඳහන් කර ඇත. ඉහත ප්‍රකාශය මත බිලෙහි වෙනස් කිරීමක් සිදු කර තිබෙන බවද ගම්‍ය වේ. ඉහත වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ වරප්‍රසාද ලබන සේවකයින් 101 දෙනෙක් පරීක්ෂාවේදී ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර තිබූ බව හෙළි වූ බව වගඋත්තරකරු සඳහන් කල අතර, ඉල්ලුම්කාරිය ප්‍රතික්ෂේප කොට නොතිබුණි. මුල්‍ය වංචාවක් බරපතල ගනයේ චෝදනාවක් බව පිළිගත හැකි අතර, එවැනි විටක එහි අගය වැදගත් වන්නේද නැත. ඉහත චෝදනාව බරපතල ගනයේ චෝදනාවක් ලෙස සැලකිය හැකි හෙයින් වසර 05 කට වෛද්‍යාධාර අහිමි කිරීම පොදුවේ ගත් තීරණයක් වන හෙයින් අසාධාරණයක් නොවන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති හතරවන ආරවුල මෙසේය.

"එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය වයස අවුරුදු හතලිස් පහ (45) සම්පූර්ණවීම මත යතුරු ලේඛක සේවයේ II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමෙහි පිළිවෙත (චක්‍රලේඛය) ඇයට ක්‍රියාත්මක කළ යුතුව තිබුනේද, එසේ වූයේ නම් ඇයට කුමන සහනයක් ලැබිය යුතුද" යන්නයි.

ඉල්ලුම්කාරිය 1986.02.17 වැනි දින සේවයට බැඳී ඇත්තේ III වන පන්තියේ සිංහල යතුරු ලේඛිකාවක් වශයෙනි. ඉල්ලුම්කාර පාර්ශවය උසස්වීම් පරිපාටිය අදාළ චක්‍ර ලේඛය A/02 ඉල්ලුම්කාරිය 1986.02.17 වැනි දින සේවයට බැඳී ඇත්තේ III වන පන්තියේ සිංහල යතුරු ලේඛිකාවක් වශයෙනි. ඉල්ලුම්කාර පාර්ශවය උසස්වීම් පරිපාටියට අදාළ චක්‍ර ලේඛය A/02 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණි. ඉල්ලුම්කාරිය කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිට නැති හෙයින් ඊළඟ ශ්‍රේණියට උසස්වීම ලබාගත හැක්කේ අවුරුදු 10 ක කාලයක් සේවය කිරීමෙන් අනතුරුව බව A/02 ලේඛනය අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කාරියගේ සේවා කාලය තුළදී කරන ලද විෂමචාර ක්‍රියා සම්බන්ධයෙන් අවවාද ලබාදී තිබීම, වැටුප් වර්ධකයක් ගෙවීම ප්‍රමාද කිරීම යන හේතූන් මත 1997.02.17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරක් ප්‍රමාද වී II පන්තියේ "ආ" ඛණ්ඩය ලැබී තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

වයස අවුරුදු 45 ඉක්මවීම මත කාරයක්ෂමතා කඩඉමෙන් නිදහස් කර ගැනීමට ඉල්ලීමක් 1999.01.30 වැනි දින ඉදිරිපත් කල බව ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර ඇතත්, වගඋත්තරකරු එම කරුණ බේරුම්කරණයේද ප්‍රතික්ෂේප කර තිබිණ. ඊට අදාළ ලේඛනයක් A/04 වශයෙන් ලකුණු කලද, එම ලේඛනය ඔප්පු කිරීමට යටත්ව ලකුණු කර තිබූ බැවින් ඔප්පු නොකිරීම මත නඩුව අවසානයේදී භාර දීමටද ඉල්ලුම්කාරිය අපොහොසත් විය. වගඋත්තරකරු සඳහන් කර සිටින්නේ ඉල්ලුම්කාරිය එවැනි ඉල්ලීමක් කර ඇත්තේ 2000.08.08 වැනි දින බවද මෙම ලිපියේ ඉල්ලුම්කාරිය අත්සන් කර නොමැති බවත්ය. ඉහත ලේඛනය වගඋත්තරකරු R/15 වශයෙන් ලකුණු කොට තිබූ අතර, ලේඛන නිරීක්ෂනය කිරීමේදී ඉහත සාක්ෂිය නිවැරදි බව පිළිගත හැකිය. නැවතත් ලිපියක් 2001.08.28 වැනි දින ඉදිරිපත් කර ඇති අතර, එම ලිපියේ පිටපතක් වගඋත්තරකරු R/15 "a" වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කර තිබිණ. ඉහත ලිපිවල 1999.01.30 වැනි දින යවන ලද ලිපියක් පිළිබඳව කරුණු සඳහන්ව නැති බව ඉහත ලේඛනවල සඳහන් කරුණු අනුව අනාවරණය වේ.

2002.01.23 වැනි දින දරන R/21 ලිපිය පරිදි වයස අවුරුදු 45 ඉක්මවීම මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට නිර්දේශ කිරීමක් සිදු කර තිබෙන බව ඉහත ලිපියේ දැක්වේ. 2005.09.19 වැනි දින දරන A/10 ලිපිය මගින් ඉල්ලුම්කාරිය කාර්යක්ෂමතා කඩඉමෙන් 2005.02.28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිදහස් කර තිබෙන බව ඉහත ලේඛනය අනුව පිළිගත හැකිය.

වගඋත්තරකරු නිකුත් කරන ලද 2009.01.17 වැනි දින දරන A/11 ලිපිය පරිදි 2007.02.28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කාරිය II ශ්‍රේණියේ "අ" කාණ්ඩයට උසස්වීම් ලබා දී ඇත.

ඉල්ලුම්කාරියට හිම උසස්වීම හා වැටුප් වර්ධක ලබා නොදීම මත පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයාට කරන ලද පැමිණිල්ලක් මත ඉල්ලුම්කාරියට සහනයක් ලබාදෙන ලෙස දැනුම් දීම මත ඉල්ලුම්කාරිය විශ්‍රාම යාමෙන් අනතුරුව සහනයක් ලබාදී තිබූ බව වගඋත්තරකරු සඳහන් කල අතර ඊට අදාළ සහනයන් දැක්වෙන ලේඛනය වගඋත්තරකරු R/40 වශයෙන්ද, එම ලේඛනයේ ඉල්ලුම්කාරිය සතු ලේඛනය A/14 වශයෙන්ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

ඉහත ලේඛනය පරිදි 1997.02.17 වැනි දින ඉල්ලුම්කාරිය II "ආ" තනතුරට පත් කර තිබූ හෙයින් එකී තනතුරේ අවුරුදු 07 ක සේවා කාලයකින් පසුව A/02 චක්‍ර ලේඛය පරිදි 2004.02.17 වැනි දින සිට II "අ" කණ්ඩයට උසස්වීම ලබාදී තිබූ බව වගඋත්තරකරු සඳහන් කල අතර, ඉහත කරුණ A/14 හා R/40 ලේඛන අනුව සනාථ වේ. ඉල්ලුම්කාරියද ඉහත කරුණු පිළිගෙන තිබිණ. II "ආ" ශ්‍රේණියේ අවුරුදු 07 ක් සේවය කිරීමෙන් අනතුරුව I වන ශ්‍රේණිය ලබාගත හැකි බව වගඋත්තරකරු සඳහන් කල අතර, ඒ අනුව 2011.02.17 වැනි දින එම ශ්‍රේණිය ලැබිය යුතු වුවද ඉල්ලුම්කාරිය 2010.09.04 වැනි දින විශ්‍රාම ලැබීම හේතු කොට ගෙන ඉහත ශ්‍රේණිය ලබා ගැනීමට අවස්ථාවක් ලැබී නැති බව පිළිගත හැකිය. ඒ අනුව A/02 චක්‍රලේඛය පරිදි ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් කටයුතු කර තිබෙන බවද, ඉල්ලුම්කාරිය I වන ශ්‍රේණිය ලබා ගැනීමට අදාළව පුහුණුවීම් පන්තියකට සහභාගී වුවද, විශ්‍රාම වයස එළඹීම මත I වන ශ්‍රේණිය ලැබී නොතිබූ බවද ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

A/02 චක්‍ර ලේඛනය ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියාත්මකව තිබෙන බවද, ඉල්ලුම්කාරියට ලැබිය යුතු උසස්වීම් ලැබී තිබෙන බවද ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු වේ.

ඉහත සඳහන් සියළුම කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම්කාරියට 1999, 2000 හා 2001 යන වසරවලට හිමි නොගෙවූ වැටුප් වර්ධක හා ඊට අදාළව විශ්‍රාම වැටුප ලබාදීම සුදුසු බවද, ඉහත කාලයට අදාළ වැටුප් තලය හා වැටුප් වර්ධක ප්‍රමාණයන් නිවැරදිව බේරුම්කරණයට ඉල්ලුම්කාරිය ඉදිරිපත් කර නොතිබුණි. එම කරුණද සැලකිල්ලට ගෙන ඉල්ලුම්කාරියට නොගෙවන ලද 1999, 2000 හා 2001 වසරවල වැටුප් වර්ධක හා ඊට අදාල විශ්‍රාම වැටුප ගෙවන ලෙස ඉහත වගඋත්තරකරුට මම නියෝග කරමි. මෙය සාධාරණ සහ යුක්තිසහගත ප්‍රදානයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

2013.09.03 වැනි දින දී ය.

11-129